# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2254/3 - 2021 නොවැම්බර් මස 15 වැනි සඳුදා - 2021.11.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(2) වගන්තිය යටතේ වූ නිවේදනය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, මෙම නිවේදනය මඟින් පහත දැක්වෙන පරිදි ප්‍රකාශයට පත් කරමි; එනම්-

(1) එ.ජ.ඩො. මිලියන 821.6 ක අපේක්ෂිත ආයෝජනයක් සමගින් චයිනා හාබර් ඉංජිනියරින් කම්පැනි ලිමිටඩ් යන සමාගම (මෙහි මින්මතු "CHEC" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් රාජගිරිය හරහා නව කැළණි පාලමේ සිට අතුරුගිරිය දක්වා (NKBA) වූ මංතීරු හතරක අධිවේගී ගුවන් මාර්ගයක් ඉදිකර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය (මෙහි මින්මතු ''ව්‍යාපෘතිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (මෙහි මින්මතු ''SDP පනත'' යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගන්නා ලදී. නිර්මාණය කිරීමේ-ඉදිකිරීමේ-මූල්‍යකරණය කිරීමේ-මෙහෙයවීමේ-නඩත්තු කිරීමේ සහ භාර දීමේ පදනමක් යටතේ (DBFOMH) සියයට 100 ක විදේශ අරමුදල් සහිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර CHEC NKBA එලිවේටඩ් හයිවේ (ප්‍රයිවට්) ලිමිටඩ් (මෙහි මින්මතු ''ව්‍යාපෘති සමාගම'' යනුවෙන් සඳහන් කරනු ලබන) යන ආයතනය විසින් මෙම ව්‍යාපෘතිය ඉදිකර, ක්‍රියාත්මක කර, නඩත්තු කරනු ලැබේ. අදාළ අනුග්‍රාහකත්ව ගිවිසුම ක්‍රියාත්මක වන දින සිට ව්‍යාපෘතිය ඉදි කිරීමේ කාලසීමාව අවුරුදු තුනක් (03) වන අතර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ නඩත්තු කිරීමේ කාලසීමාව ඉදිකිරීම් කාලසීමාව අවසන්වීමෙන් පසුව අවුරුදු පහළොවක් (15) ක් වේ (සම්පූර්ණ එකතුව අවුරුදු දහඅටක් (18) වේ). ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සහ පවත්වාගෙන යෑමේ කාලසීමාව සම්පූර්ණ කිරීමෙන් පසුව, ව්‍යාපෘති සමාගම විසින් මෙම ව්‍යාපෘතිය මහාමාර්ග අමාත්‍යාංශය වෙත භාර දෙනු ලැබිය යුතු වේ.

(2) CHEC, චීනයේ ලියාපදිංචි, 1980 වර්ෂයේදී ආරම්භ කරන ලද, ඩොංග් ෂී මෙන් වායි, බීජිං, චීනය යන ස්ථානයේ ව්‍යාපාරික මූලස්ථානය පිහිටා ඇති ලංසුකරු වේ. CHEC යනු සමුද්‍රීය ඉංජිනේරු විද්‍යාව, මාර්ග සහ පාලම් කටයුතු, කැණීම් සහ ගොඩකිරීම් කටයුතු, දුම්රිය මාර්ග සහ ගුවන්තොටුපළ වැනි යටිතල පහසුකම් සංවර්ධනයේ විශේෂඥභාවයට පත්වී ඇති ඉංජිනේරු සමාගමක් වේ. තවද, CHEC යනු ව්‍යාපෘතියේ ඉංජිනේරු කටයුතු, ප්‍රසම්පාදන සහ ඉදිකිරීම් කටයුතු පවත්වාගෙන යනු ලබන කොන්ත්‍රාත්කරු ද වේ. CHEC, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, CHEC සමාගම විසින් සියයට 100 ක් සන්තකය දරනු ලබන ස්වකීය මව් සමාගම හෝ ආශ්‍රිත සමාගමක් හරහා ශ්‍රී ලංකාවේ නීති යටතේ විශේෂ කාර්යය සමාගමක් පිහිටුවනු ඇත.

1A - G 35363 - 60 (2021/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(3) මෙම ව්‍යාපෘතිය එ.ජ.ඩො.මිලියන 821.60 ක ගිවිසුම්ගත ආයෝජනයක් සහිත මාර්ග ක්ෂේත්‍රයේ විශාලතම විදේශ ආයෝජනවලින් එක් ආයෝජන ව්‍යාපෘතියක් වන අතර ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලසීමාව තුළදී එම ආයෝජනය එ.ජ.ඩො. මිලියන 246.50 ක ප්‍රාග්ධන දායකත්වයක් සහ එ.ජ.ඩො. මිලියන 575.10 ක ණය මුදලක් වශයෙන් ව්‍යාපෘතිය සඳහා මූල්‍ය සම්පාදනය කිරීමට අපේක්ෂිතය.

(4) ව්‍යාපෘතිය විසින් පහත දැක්වෙන නියම හා කොන්දේසි සපුරාලීමට යටත්ව, SDP පනත ප්‍රකාරව ව්‍යාපෘතිය වෙත බදු නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ. එනම් :-

(අ) අදාළ සහන ගිවිසුමේ දක්වා ඇති ක්‍රියාත්මක වන දින සිට ආරම්භව වසර තුන (03) ක ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය සඳහා අවම වශයෙන් එ.ජ.ඩො. මිලියන 821.60 ආයෝජනයක් සිදු කළ යුතුය.

(ආ) අවුරුදු දහඅටක (18) ව්‍යාපෘතිය ඉදි කිරීමේ, මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව අවසන් කිරීමෙන් පසුව ව්‍යාපෘතිය මහාමාර්ග අමාත්‍යාංශය වෙත භාර දෙනු ලැබිය යුතුය.

(5) ව්‍යාපෘති සමාගම සහ මහාමාර්ග අමාත්‍යාංශය අතර එකඟ වූ පිරිවිතරයන්ට අනුකූලව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය. මහාමාර්ග අමාත්‍යාංශය විසින් ගාස්තු එකතු කිරීමේ කටයුතු සිදු කරනු ලැබිය යුතුය.

(6) ඉහත කී ව්‍යාපෘතියේ කාර්යය සඳහා, මෙම නිවේදනයේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බදු නිදහස් කිරීම් SDP පනත ප්‍රකාරව අදාළ විය යුතුය.

## උපලේඛනය

**(1) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

**(අ)** සංස්ථාපිත ආදායම් බද්ද

අවුරුදු තුනක (3) ඉදිකිරීම් කාලසීමාව තුළදී සහ ඉදිකිරීම් කාලසීමාවෙන් පසුව එළඹෙන අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී, ව්‍යාපෘතිය විසින් උපයනු ලබන ලාභ සහ ආදායම, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ සංස්ථාපිත ආදායම් බද්ද ගෙවීමෙන් නිදහස් වන්නේය.

**(ආ)** ලාභාංශ මත බද්ද

අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී සහ ඉන්පසුව එක් අවුරුද්දක් (01) සඳහා ව්‍යාපෘති සමාගමේ කොටස්හිමියන් වෙත බෙදා දෙනු ලබන ලාභාංශ සම්බන්ධයෙන් වන ලාභාංශ මත බදු ගෙවීමෙන් නිදහස් වන්නේය.

**(ඇ)** විදේශ ණය සඳහා ගෙවනු ලබන පොළිය මත, උපදේශකවරුන් සඳහා ගෙවනු ලබන ගාස්තු මත, කළමනාකරණ ගාස්තු මත සහ රාජ්‍ය භාගය (Royalty payment) මත අයකරනු ලබන බද්ද

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බද්ද (WHT) ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය

(i) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගන්නා විදේශ ණය පොළිය මත;

(ii) අවුරුදු තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී උපදේශකවරුන් සඳහා (හතළිස් දෙනකු (40) දක්වා) ගෙවනු ලබන ගාස්තු සහ ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව අවුරුදු පහළොවක (15) නඩත්තු කිරීමේ කාල සීමාව තුළදී උපදේශකවරුන් විස්සක් (20) දක්වා ප්‍රමාණයකට ගෙවනු ලබන ගාස්තු මත; සහ

(iii) අවුරුදු තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් සියයට පහක් (05) නොඉක්මවන කළමනාකරණ ගාස්තු සහ රාජ්‍ය භාගය ගෙවීම් (Royalty payment) මත සහ ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාල සීමාවෙන් පසුව එළඹෙන අවුරුදු පහළොවක (15) නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් සියයට දෙකක් (02) නොඉක්මවන කළමනාකරණ ගාස්තු සහ රාජ්‍ය භාගය ගෙවීම් මත (Royalty payment);

**(ඈ)** ප්‍රාග්ධන ලාභ බද්ද

අවුරුදු තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී සහ එම ඉදිකිරීම් කාලසීමාව අවසන්වීමෙන් පසුව අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී ප්‍රාග්ධන ලාභ බද්ද ගෙවීමෙන් ව්‍යාපෘති සමාගමේ කොටස් හිමියන් සහ ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

(ඉ) <u>සේවා නියුක්තිය මත ආදායම් බද්ද</u>

ව්‍යාපෘතිය සම්බන්ධ සේවා නියුක්තියෙන් උපචිත වන ලැබීම් සහ ලාභ තුළින් උත්පාදනය වන ආදායම් බදු ව්‍යාපෘති සමාගමේ විදේශීය සේවා නියුක්තිකයන් (තාක්ෂණික සහ කළමනාකරණ ප්‍රවීනයන්) පහත ආකාරයට නිදහස් වන්නේය.

(i) ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමේ දින සිට අවුරුදු තුනක (03) කාලසීමාවක් දක්වා (උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් හතළිස් දෙනකුට (40) යටත්ව).

(ii) ඉදිකිරීම් කාලසීමාවෙන් පසුව අවුරුදු පහළොවක (15) කාලසීමාවක් දක්වා (උපරිම වශයෙන් විදේශීය සේවා නියුක්තිකයන් විසි දෙනකුට (20) යටත්ව).

**(2) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (VAT පනත)**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (මෙහි මින්මතු ''BOI'' යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත සියළු භාණ්ඩ ආනයනය කිරීම් සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සේවාවන්, අවුරුදු තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී සහ ඉදිකිරීම් කාලසීමාව අවසන්වීමෙන් පසුව එළඹෙන අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී එකතු කළ අගය මත බදු (VAT) ගෙවීමෙන් නිදහස් වන්නේය. BOI විසින් අනුමත කරනු ලබන ආකාරයට ව්‍යාපෘතිය ආශ්‍රිත භාණ්ඩ දේශීය වශයෙන් මිලදී ගැනීම් මත හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන සේවා මත අයකරනු ලබන VAT බදු ව්‍යාපෘතිය ඉදිකිරීමේ අවුරුදු තුනක (03) කාලසීමාව තුළදී සහ එම ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ අවුරුදු පහළොවක (15) කාලසීමාව තුළදී විලම්භනය කරනු ලැබේ.

තවද, අනුග්‍රාහකත්ව ගිවිසුම යටතේ ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘති සමාගම වෙත ලබාදිය යුතු අර්ධ වාර්ෂික සේවා ගාස්තුවෙන් ලැබිය යුතු පොළී ආදායම ඇතුළුව ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී VAT බදු ගෙවීමෙන් නිදහස් වන්නේය.

**(3) 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු පනත**

BOI විසින් අනුමත කරනු ලබන ව්‍යාපෘතියට අදාළ සියලු ආනයන භාණ්ඩ ව්‍යාපෘති සමාගමේ නමින් යොමු කර (consigned) ඇත්නම්, (ව්‍යාපෘති සමාගම මගින් සෘජුවම ආනයනය කළ හෝ යම් කොන්ත්‍රාත්කරුවකු (කොන්ත්‍රාත්කරුවන්) හෝ උප-කොන්ත්‍රාත්කරුවකු (උප- කොන්ත්‍රාත්කරුවන්) හරහා ලබා ගත්ත ද) අවුරුදු තුනක (03) ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලසීමාව තුළදී සහ අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී හෝ ඉදිකිරීම් ආරම්භ කිරීමේ දිනයේ සිට ආරම්භ වන අවුරුදු දහඅටක (18) සමස්ත කාලසීමාව තුළදී එම ව්‍යාපෘතියට අදාළ සියලුම ආනයන භාණ්ඩ මත වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (PAL) අය කිරීමෙන් සහ ගෙවීමෙන් ව්‍යාපෘති සමාගම නිදහස් වන්නේය.

**(4) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

BOI විසින් අනුමත කරන ලබන ව්‍යාපෘතියට අදාළ ආනයන භාණ්ඩ ව්‍යාපෘති සමාගමේ නමින් යොමු කර (consigned) ඇත්නම්, ව්‍යාපෘති සමාගම, එහි කොන්ත්‍රාත්කරු (කොන්ත්‍රාත්කරුවන්) සහ උප-කොන්ත්‍රාත්කරු (උප-කොන්ත්‍රාත්කරුවන්) විසින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතිය ආශ්‍රිත ආනයන අයිතම, අවුරුදු තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී සහ ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී නිෂ්පාදන බදු අයකිරීමෙන් සහ ගෙවීමෙන් නිදහස් වන්නේය.

**(5) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

BOI විසින් අනුමත කරන ලබන ව්‍යාපෘතියට අදාළ ආනයන භාණ්ඩ ව්‍යාපෘති සමාගමේ නමින් යොමු කර (consigned) ඇත්නම්, ව්‍යාපෘති සමාගම, එහි කොන්ත්‍රාත්කරු (කොන්ත්‍රාත්කරුවන්) සහ උප-කොන්ත්‍රාත්කරු (උප-කොන්ත්‍රාත්කරුවන්) විසින් ආනයනය කරනු ලබන ව්‍යාපෘතියට අදාල ආනයන අයිතම, අවුරුදු තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී සහ ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී සෙස් බදු (CESS) අයකිරීමෙන් සහ ගෙවීමෙන් නිදහස් වන්නේය.

**(6) රේගු ආඥාපනත (235 වන පරිච්ඡේදය)**

BOI විසින් අනුමත කරනු ලබන (මුදල් අමාත්‍යාංශය විසින් පළ කරනු ලබන නිශේධන ලේඛනයේ සඳහන් අයිතම හැර) ව්‍යාපෘතියට අදාළ ආනයන අයිතම ව්‍යාපෘති සමාගමේ නමින් යොමු කර (consigned) ඇත්නම්, ව්‍යාපෘති සමාගම විසින් සෘජුවම ආනයනය කරනු ලබන හෝ යම් කොන්ත්‍රාත්කරුවකු (කොන්ත්‍රාත්කරුවන්) හෝ උප-කොන්ත්‍රාත්කරුවකු (උප-කොන්ත්‍රාත්කරුවන්) හරහා ලබා ගනු ලබන ව්‍යාපෘතියට අදාළ සියලුම ආනයන අයිතම, අවුරුදු තුනක (03) ඉදිකිරීම් කාලසීමාව තුළදී සහ ඉදිකිරීම් කාලසීමාව අවසන් වීමෙන් පසුව එළඹෙන අවුරුදු පහළොවක (15) මෙහෙයුම් සහ නඩත්තු කිරීමේ කාලසීමාව තුළදී රේගු ආනයන බද්ද (CID) අය කිරීමෙන් සහ ගෙවීමෙන් නිදහස් වන්නේය.

එසේ වුවද, නිශේධන ලේඛනයේ සඳහන් අයිතම ප්‍රමාණවත් තත්ත්වයෙන්, ප්‍රමාණයෙන් සහ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමේ කාලසීමාව සැලකීමේ දී ශ්‍රී ලංකාව තුළදී සම්පූර්ණයෙන්ම නිෂ්පාදනය කරනු නොලබන හෝ ලබා ගත නොහැකි වන අවස්ථාවකදී, එම නිශේධන ලේඛනයේ සඳහන් අයිතම ආනයනය කිරීම පිළිබඳව BOI විසින් සලකා බලනු ලැබිය යුතුය.

තවද, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා, උපලේඛනයේ 2 වන වගන්තියේ සිට 6 වැනි වගන්තිය දක්වා ඕනෑම ආනයනයක් සඳහා අදාල වන සහන, එම සහන ගිවිසුම අත්සන් කළ දිනය සහ ක්‍රියාත්මක වන දිනය අතර කාලසීමාවට ද අදාළ වේ.

**මහින්ද රාජපක්ෂ, පා.ම,**
ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍ය.

ආර්ථික ප්‍රතිපත්ති සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය,
2021 නොවැම්බර් 15 වැනි දින.

11-687

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.